# දැන්වීමයි

# මැතිවරණ කොමිෂන් සභාව

## මැතිවරණ කොමිෂන් සභාව විසින් 2026 වර්ෂයේ දේශපාලන පක්ෂ පිළිගැනීම සඳහා සුදුසුකම් ඇති ක්‍රියාකාරී දේශපාලන පක්ෂ වෙතින් 2026.01.28 වන දින සිට 2026.02.28 වන දින තෙක් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. 2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(4)(අ) වගන්තිය අනුව මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීම සඳහා වූ අයදුම්පත් 2026.01.28 වන දින සිට 2026.02.28 දින ප.ව 3.00 දක්වා භාරගනු ලැබේ. අදාළ අයදුම්පත් මැතිවරණ කොමිෂන් සභාව වෙත අදාළ පක්ෂයේ ලේකම්වරයා විසින් ලියාපදිංචි තැපැලෙන් යොමු කිරීමට හෝ පැමිණ භාරදීම සිදු කළ හැකිය. එම අයදුම්පත් යොමු කිරීමේ දී ලිපිකවරයේ ඉහළ වම්පස "**දේශපාලන පක්ෂ පිළිගැනීම වෙනුවෙන් අයදුම් පත්‍රය - 2026**" යනුවෙන් සඳහන් කළ යුතු වේ. ලියාපදිංචි තැපැලෙන් එවනු ලබන අයදුම්පත් සභාපති, මැතිවරණ කොමිෂන් සභාව , සරණ මාවත, රාජගිරිය (10107) යන ලිපිනයට යොමු කළ යුතු වේ.

02. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයෙහි නියමිත වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව ක්‍රියා කරනු නොලැබේ.

03. දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීම සඳහා ඉල්ලුම් කරනු ලබන අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර අංක 2472/21 හා 2026.01.21 දිනැති ගැසට් පත්‍රයේ සඳහන් නිර්ණායක අනුව නියමිතව සකස් කරන ලද ලේඛන ද සමග පක්ෂයේ ලේකම්වරයා විසින් අත්සන් කරනු ලැබ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

04. අයදුම්පත්‍රය, මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.election.gov.lk) මගින් බාගත කර ගත හැකි අතර, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මගින් හා මැතිවරණ මහලේකම් කාර්යාලයෙන් ද අදාළ අයදුම්පත ලබා ගත හැකි ය.

05. පක්ෂය පිළිගනු ලැබුවහොත් අංක 2471/24 හා 2026.01.13 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් අනුමත කරන ලද (ආ) උප ලේඛනයේ සඳහන් පක්ෂ ලකුණු අතුරින් එම පක්ෂය සඳහා වෙන් කරගනු ලැබීමට අපේක්ෂා කරනු ලබන්නේ කවර ලකුණක් ද යන්න එම ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් කළ යුතුය.

06. අයදුම් පත්‍රය සම්පූර්ණ කර ඒ සමග පහත සඳහන් ලේඛනවල සහතික කළ ඡායා පිටපත් මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය වුවහොත් මුල් පිටපත් පරීක්ෂා කර බලනු ඇත.

    6.1 පක්ෂ ව්‍යවස්ථාව

    6.2 පක්ෂයේ නිලධාරී මණ්ඩලයේ ලැයිස්තුව

    6.3 පක්ෂයේ කාන්තා නිලධාරීන්ගේ නම් (පසුගිය වසර 04 ක)

    6.4 පක්ෂයේ විගණනය කර ලද ගිණුම් ප්‍රකාශ (අයදුම්පත ඉදිරිපත් කරන වසරට පූර්ව වසර හතරක කාලය සඳහා)

    6.5 පක්ෂයේ තත්කාලීන ප්‍රතිපත්ති ප්‍රකාශය.

    6.6 දේශපාලන පක්ෂයක් වශයෙන් ආසන්නතම වූ වසර හතරකවත් කාලය තුළ අඛණ්ඩව ක්‍රියාත්මක වූ බව සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි සියලුම ලිපි ලේඛන වෙන වෙනම ගොනු 04ක වර්ෂ අනුව බෙදා ඉදිරිපත් කළ යුතුය.

07. පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීමට කෙරෙන ඉල්ලීමක් සම්බන්ධයෙන් 2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතෙන් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(5), (6) හා (7) යන නියමයන් තීරණාත්මක හා අවසානාත්මක වේ.

08. ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ දී අංක 2472/21 හා 2026.01.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ දේශපාලන පක්ෂ පිළිගැනීම සම්බන්ධ 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 8(9) උප වගන්තිය අනුව පනතේ 7 වන වගන්තියෙහි සඳහන් මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස පිළිගැනීම බලාත්මක කිරීම හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන විධාන අනුව කටයුතු කර ඇති බව සනාථ කළයුතු වේ.

**ආර්.එම්.ඒ.එල්. රත්නායක**
**සභාපති, මැතිවරණ කොමිෂන් සභාව**

**මැතිවරණ කොමිෂන් සභාව,**
**මැතිවරණ මහලේකම් කාර්යාලය,**
**සරණ මාවත, රාජගිරිය (10107)**
**2026 ජනවාරි මස 28 දින**

**සටහන - මේ පිළිබඳව 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ විධිවිධාන පරිශීලනය කිරීම යෙහෙකි.**